# <u>සිංහල භාෂාව හා සාහිත්‍යය</u>

## <u>වතුර මල</u>

ශ්‍රේණිය -: 11

වාරය -: තුන්වන වාරය

නිපුණතා මට්ටම් -: 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

-: 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම - 01**

- පාඩම කියවා පිළිතුරු සපයන්න.

1. මනුෂ්‍යයා කතාන්තර කීම අරඹන්නට ඇත්තේ ඇයි ?

   ........................................................................................................................

2. ඉන් පසුව බිහිවූයේ කවර ආකාරයේ කතා කලාවක් ද ?

   ........................................................................................................................

3. සාහිත්‍යාංගයක් ලෙස කෙටිකතාව වැදගත් වන්නේ ඇයි ?

   ........................................................................................................................

4. කෙටිකතා රචනයට අවශ්‍ය පරිචය ලබා ගැනීමට වැදගත් වන්නේ කුමක් ද?

   ........................................................................................................................

5. කෙටිකතාව පිළිබඳ ව ඇන්ටන් චෙකොෆ් දැක් වූ අදහස කුමක් ද?

   ........................................................................................................................

6. ජෝසප් බර්ග් එසන්වීන් කෙටිකතාව පිළිබඳ ව දක්වා ඇති නිර්වචනය කුමක් ද?

   ........................................................................................................................

7. 1983 වසරේ හොඳම සිංහල කෙටිකතා සංග්‍රහය ලෙස සම්මානයට පාත්‍ර වූ කෙටිකතා සංග්‍රහය කුමක් ද?

   ........................................................................................................................

8. එහි කතුවරයා කවු ද?

   ........................................................................................................................

9. “තේමාව” යන්නට පර්යාය පද දෙකක් ලියන්න.

   ........................................................................................................................

10. කෙටිකතාවේ මුඛ්‍යාංග දක්වන්න.

    ........................................................................................................................

**ක්‍රියාකාරකම - 02**

- වතුර මල කෙටිකතාව කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කෙටිකතාවේ සිද්ධීන් හා බැඳුණු චරිත දෙක නම් කරන්න.
   ..............................................................................................................................
2. ඔවුන්ගේ කතා බහට ලක් වන කරුණු මොනවා ද?
   ..............................................................................................................................
3. පන්සල් භූමියේ වතුර මලක් ඉදිකරන්නට සිතුවේ කවු ද?
   ..............................................................................................................................
4. එසේ ඉදිකිරීම සඳහා ඔහු මෙහෙය වූ හේතුව කුමක් ද?
   ..............................................................................................................................

5. ඉදි කළ නිර්මාණයේ ස්වභාවය පහත සඳහන් අංග ඔස්සේ සඳහන් කරන්න.

I. පොකුණ
II. නෙළුම් මල
III. තීන්ත ආලේපය
IV. ගරාදි වැට
V. විදුලි බුබුළ

6. ලොකු කුඩා අය වතුර මල නිසා සතුටට පත් වූ අයුරු පෙන්නුම් කරන කරුණු දෙකක් ලියන්න.
   ..............................................................................................................................
7. වතුර මල විනාශ කර දැමුවේ කවු ද?
   ..............................................................................................................................
8. වතුර මල විනාශ කර දමා තිබූ ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.
   ..............................................................................................................................
9. වතුර මල විනාශ කර දැමූ පුද්ගලයා පිළිබඳ ව අබිලින් උන්නැහේට ලොකු හාමුදුරුවන් දැනුම් දීමට සිතුවේ ඇයි ?
   ..............................................................................................................................
10. වතුර මල කඩා දැමීමේ හේතුව ලෙස ලොකු හාමුදුරුවන් සිතන්නේ කුමක් ද?
   ..............................................................................................................................

**ක්‍රියාකාරකම - 03**

- වතුර මල කෙටිකතාව කියවා පහත දැක්වෙන ප්‍රකාශ කා විසින් කා හට කියන ලද්දැයි දක්වන්න.

| ප්‍රකාශය | කා විසින් | කා හට |
|---|---|---|
| 1. "මම මේ වැඩේට සතයක් වත් සම්මාදන් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ." | | |
| 2. "මම දැන් තේ එකක් බීපු ගමන් ආවේ." | | |
| 3. "ඔව් ඉතින්, ඔය වැඩේ නම් නරකයි කියන්න බැහැ." | | |
| 4. "වතුර මල නම් හරි ලස්සනයි." | | |
| 5. "මටත් ඕක ආරංචි වුණා." | | |
| 6. "කෝපි කෝප්පයක් හදාගෙන වරෙල්ලා." | | |
| 7. "කවුද පාහරයෙක් කරලා තියෙන අපරාධයක මහත." | | |
| 8. "ඔන්න ඔය හින්ද ම මම කල්පනා කළා විහාරෙ ළඟින් වතුර මලක් හදන්න." | | |

**ක්‍රියාකාරකම - 04**

- වතුර මල කෙටිකතාවේ නිර්මාණාත්මක භාෂා ලක්ෂණ හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන තොරතුරු හා සිදුවීම් නිරූපණය කර ඇති ආකාරය උපුටා දක්වන්න.

1. අබිලින් උන්නැහැගේ වියපත් භාවය.

   ..........................................................................................................................................

2. වතුර මල වර්ණනා කිරීම.

   ..........................................................................................................................................

3. සිරිමාන්න මහතාගේ කොණ්ඩය වර්ණනා කිරීම.

   ..........................................................................................................................................

4. වතුර මල නිසා ළමයින් ලබන ආස්වාදය.

   ..........................................................................................................................................

5. අබිලින් උන්නැහැගේ දවසේ වැඩ නිම කොට සැඳෑ සුවය විඳීම.

   ..........................................................................................................................................

**ක්‍රියාකාරකම - 05**

- වතුර මල කෙටිකතාවේ ප්‍රධාන පුද්ගල චරිතද්වයෙහි චරිත ලක්ෂණ නිරූපණය කර ඇති ආකාරය මුල් තීරුවෙහි දැක්වෙන කරුණුවලට අදාළ ව උපුටා දක්වන්න.

| **චරිත ලක්ෂණ** | **සිරිමාන්න මහතා** | **අබිලින් උන්නැහේ** |
|---|---|---|
| 1. ජීවනෝපාය | | |
| 2. දරුවෝ | | |
| 3. දින චරියාව | | |
| 4. බාහිර චරිත ලක්ෂණ | | |
| 5. අභ්‍යන්තර චරිත ලක්ෂණ | | |

**ක්‍රියාකාරකම - 06**

1. වතුර මල කෙටි කතාවේ ඔබ සිත් ගත් අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
2. කෙටි කතාවෙන් මතු කරන ජීවන දෘෂ්ටිය කෙටියෙන් පැහැදිලි කරන්න.
3. මෙය රචනා වී ඇති දෘෂ්ටි කෝණය කවරේ ද?

**ක්‍රියාකාරකම - 07**

- පහත සඳහන් ස්ථානයක වූ සිදුවීමක් ඇසුරෙන් කෙටි කතාවක් නිර්මාණය කරන්න.

1. පන්ති කාමරයක්
2. දිළිඳු නිවසක්
3. රෝහලක්
4. ක්‍රීඩා උත්සවයක්
5. වැඩිහිටි නිවාසයක්

# <u>පිළිතුරු</u>

# <u>වතුර මල</u>

**ක්‍රියාකාරකම - 01**

1. සිය අත්දැකීම් සෙසු සාමාජිකයන්ට කියා පෑමට සහ ඊළඟ පරම්පරාවට අත්දැකීම් උරුම කර දීමට.
2. ආගමික හා උපදේශාත්මක කථා කලාවක් .
3. විවිධ මානව අත්දැකීම් පදනම් කරගත් සාහිත්‍යාංගයක් ලෙස.
4. සාර්ථක කෙටි කතා පරිශීලනය.
5. '' කෙටිකතාවක් යනු ජීවිතයෙන් පෙත්තක් විවරණය කිරීමක්. ''
6. "කෙටිකතාව වනාහි අනෙක් සිද්ධි අබිබවා සිටින එක් ප්‍රබල සිද්ධියක් හා එක් ප්‍රබල චරිතයක් අනාවරණය කරන්නා වූ ද, එකට කැටි ව තිබෙන කථා වින්‍යාසයක් සහිත වූ ද, ඒකත්වයෙන් යුක්ත ධාරණාවක් ඇත්තා වූ ද, අඩු දිග ප්‍රමාණයකින් යුක්ත වූ ද පරිකල්පනාත්මක ආඛ්‍යානයකි."
7. සුදු කොඩි
8. ඇරැව්වල නන්දිමිත්‍ර
9. අනුභූතිය, අත්දැකීම
10. කතා ප්‍රවෘත්තිය, කතා වින්‍යාසය, චරිත නිරූපණය, යථාර්ථ නිරූපණය, සංකේත භාවිතය, දෘෂ්ටි කෝණය, ජීවන දෘෂ්ටිය, නිර්මාණාත්මක භාෂාව

**ක්‍රියාකාරකම 02**

1. සිරිමාන්න මහත්තයා හා අබිලින් උන්නැහේ
2. දරුවන් පිළිබඳ, රටේ තොටේ ආරංචි, ගොවිතැන් වැඩ ආදිය
3. අබිලින් උන්නැහේ
4. මල් පූජා කිරීමට එන අයට පැන් ගෙන එන්නට කීප සැරයක් ළිඳ ළඟට යන්නට සිදුවීම.
5. 
   i. කවාකාර බැම්මකින් යුතු ය. නිලට නිලේ ජලය පිරී ඇත.
   ii. පොකුණ මැද තනන ලද නටුව මත පිපුණු නෙළුම් මලකි.
   iii. රන් පැහැය, කොළ පැහැය
   iv. පොකුණ වටා රිදීපාට යකඩ වැටකි.
   v. වතුර මලට ආලෝකය වැටෙන සේ සවි කර ඇත.

6. වතුර මල දෙස ආශාවෙන් බලා සිටීම, දැත් ධෝවනය කිරීම.
7. සිරිමාන්න මහත්තයා
8. වතුර මලට ජලය සැපයෙන නළය සම්පූර්ණයෙන් තළා දමා ඇත. නෙළුම් මලේ පෙති මිටියකින් ගසා කඩා ඇත. බැම්ම එක් තැකනින් කඩා දමා ඇත.
9. වතුර මල කැඩූ දා සිට පිනක් දහමක් නොකර ඉන්න නිසා.
10. අබිලින් උන්නැහේ කෙරෙහි ඇති වූ ඊර්ෂ්‍යාව නිසා.

**ක්‍රියාකාරකම - 03**

1. අබිලින් විසින් සිරිමාන්නට
2. සිරිමාන්න විසින් අබිලින්ට
3. සිරිමාන්න විසින් අබිලින්ට
4. ළමයෙකු විසින් අබිලින්ට
5. සිරිමාන්න විසින් අබිලින්ට
6. අබිලින් විසින් බිරිඳට
7. අබිලින් විසින් සිරිමාන්නට
8. අබිලින් විසින් සිරිමාන්නට

**ක්‍රියාකාරකම - 04**

1. ‘‘මහලු බව හොරෙන් හොරෙන් පැමිණ මහත් වූ ආදරයකින් මෙන් ඔහු වැළඳ ගැනීමට වැර දරයි.’’
2. ‘‘වතුර මල බෙහෙවින් පියකරු ය.... එහි නිලට නිලේ ජලය පිරිලා ය....’’
3. “...තට්ටය වැසීම සඳහා හිස පසු දෙස කෙස් දිගට වවා ඉතා අමාරුවෙන් හිස ඉදිරි පසට ගෙනැවිත් තබා තිබුණේ ය.”
4. “සීතල වතුර ටිකක් අතට ගන්නා ළමයෙක් ඉන් බින්දු කීපයක් තම යහළු ළමයෙකුගේ මුහුණට ඉසියි.”
5. “පරණ පුටුවක වාඩි වී කෝපි කෝප්පයෙන්....”

**ක්‍රියාකාරකම - 06**

1. තමා සිත් ගත් අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කළ යුතු ය.
2. 
   I. මිනිස් සිත් සතන්හි පවත්නා ඊර්ෂ්‍යාව වැනි දුර්වලතා මතු කිරීම.
   II. බුද්ධ පුත්‍රයන් තුළ ලෝක සත්වයා කෙරෙහි පවත්නා අනුකම්පාව, කරුණාව, මෛත්‍රිය පෙන්වාදීම.
3. ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණය